# කෘෂි තාක්ෂණ තොරතුරු

කෘෂි තාක්ෂණ තොරතුරු කඩිනමින් ගොවි ජනතාව අතරට ලබා දීමේ අත්වැලකි.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ජාතික කෘෂි තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානයේ ප්‍රකාශනයකි.

තාක්ෂණික පත්‍රිකා අංක 16 - 2018 ඔක්තෝබර්

## ගොටුකොළ හා මුකුණුවැන්න සමඟ කෘෂි රසායනික අවශේෂ

පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලයේ විද්වතුන් කල ගවේශනයක ප්‍රතිඵලයක් වශයෙන් දිවයිනේ ප්‍රදේශ තුනකින් ගත් (කළුතර,මහනුවර හා පුත්තලම) ගොටුකොළ හා මුකුණුවැන්න සාම්පල වල අධික ප්‍රමාණ වලින් කෘෂි රසායනික ද්‍රව්‍ය ඉතිරිව පවතින බව අනාවරණය වී තිබේ. **ප්‍රොෆෙනොෆොස්, ෆිප්‍රෝනිල් ,ෆෙන්තොඒට්, ටෙබුකොනසෝල්** යන කෘෂි රසායනිකයන් මෙසේ හඳුනා ගෙන ඇත. ඇතැම් වගාකරුවන් විසින් අස්වැන්න නෙලීමේ දින වකවානු ගැන සැලකිලිමත් නොවී හිතු මනාපයට කෘෂි නාශක දියර ඉසීමත්, ආරක්ෂිත කාලයට පෙර පළා වර්ග කපා වෙළෙඳපොලට යැවීමත් නිසා මෙම අනතුරුදායක තත්ත්වය උද්ගත වී තිබේ.

### අප සැලකිලිමත් විය යුත්තේ ඇයි ?

පර්යේෂකයින් මෙම තොරතුරු අනාවරණය කරගෙන ඇත්තේ, පළිබෝධනාශක යොදා දින 7 ක් ගත වූ වගාවන්ගෙන් ලබාගත් සාම්පල වලිනි. එය වැසි සහිත කාලයක් බැවින් ඉසිනලද දැ දින 7 තුල සේදී ගොස් නැත. එමෙන්ම,

- මේවා " කහ ලේබල් " සහිත හානිදායක පළිබෝධනාශක ද්‍රව්‍ය වේ
- ටෙබුකොනසෝල් යනු ගසට උරා ගන්නා දිලීර නාශකයකි. එනම් සොදා ඉවත් කළ නොහැකිය
- ප්‍රොෆෙනපොස් ගසට උරා නොගන්නා නමුත් ජලයේ අද්‍රාව්‍ය නිසා සේදීමෙන් මුලුමනින්ම ඉවත් නොවිය හැකිය
- මෙම පළිබෝධනාශක ද්‍රව්‍ය ඉහල උෂ්ණත්ව වල දී පවා ස්ථායීව පවතින නිසා පිසින ලද ආහාර වල වුවද තිබිය හැකිය

### ගොවීන්ගේ යුතුකම

- පළා වර්ග අමුවෙන් හෝ අඩ වශයෙන් පිස අනුභව කරන බැවින් පළිබෝධනාශක ද්‍රව්‍ය යෙදීමෙන් වලකින්න
- කෘෂිකර්ම දෙපාර්තමේන්තුව පළා වර්ග සඳහා පළිබෝධනාශක ද්‍රව්‍ය නිර්දේශ කර නැත
- අවශ්‍ය නම් පමණක් කාබනික පළිබෝධනාශක ද්‍රව්‍ය යෙදීම කළ හැකිය

### පාරිභෝගිකයන්ගේ වගකීම

- හැකි පමණින් ගෙවතු වගාව හරහා තම පළා අවශ්‍යතාවය සපුරා ගන්න
- වාණිජ පළා වර්ග අනුභව කරන්නේ නම් හොඳින් ගලා යන ජලයේ සේදීම කළ යුතුය. (වතුර බේසමේ ගිල්වා සේදීමේ දී ජලය හා මුසු වන විශ ද්‍රව්‍ය ශාකයට තව තවත් අවශෝෂනය විය හැකිය)
- වාණිජ පළා වර්ග මග හැර සාම්ප්‍රදායික ගුණාත්මක කොළ එළවලු ආහාරයට ගැනීමට පුරුදු වන්න

**තාක්ෂණික කරුණු : යොෂිඩා ලක්ෂානි (සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ - පර්යේෂණ) පළිබෝධනාශක රෙජිස්ටාර් කාර්යාලය ගැටබේ.**
**දුරකථන - 081 2388076 ඊ මේල -** Pest@slt.lk

**පිටපත - සනත් එම් බණ්ඩාර - සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ ( මාධ්‍ය සම්බන්ධීකරණ )**

පරිගණක නිර්මාණය : ඉරේෂ් චානක බණ්ඩාර හේරත්

සැකසුම : කේ.එම් සිරිවර්ධන (තාක්ෂණික සහකාර - කෘෂි ව්‍යාප්ති)

අධීක්ෂණය හා උපදෙස් : එස්. පෙරියසාමි (අධ්‍යක්ෂ - තොරතුරු හා සන්නිවේදන), අයි.එස්.එම් හලීම්දීන් (සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ)